# 8 ශ්‍රේණිය සිංහල

## 14 ඒකකය

# කතරගම පූදබිම



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

පසුගිය සතියේ online පංතිය සඳහා සහභාගී වීමට නොහැකි වුනු සිසුන් සඳහා සහභාගී වූ සිසුන්ගේ උපකරයෙන් ලබා දුන් උපකාරක සටහනකි.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 14. කතරගම පුදබිම



කතරගම පුදබිම කතරගම යනු ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ නගරයක් මෙන් ම ඓතිහාසික වශයෙන් වැදගත් නගරයක් ද වේ. බුදු රාජාණන් වහන්සේ තුන්වන වරට ලංකාවට වැඩම කළ අවස්ථාවේ කතරගම පාලනය **මහාඝෝෂ** නම් පාලකයකු බවත් කතරගම ප්‍රදේශයේ ඔහුට අයත් කිහිරි වනයක බුදු රජාණන් වහන්සේ සමවත් සුවයෙන් වැඩසිටි බවත් **ධාතුවංසය** සඳහන් කරයි. රුහුණු පුරයේ මෙන් ම බුදු දහමේ ද ආරක්ෂකයා වශයෙන් සැලකෙන්නේ **කතරගම දෙවියන් ය.**

**ස්කන්ද කුමාර** යන නමින් ද හැඳින්වෙන මෙම දෙවියන්ගේ ප්‍රධාන දේවාලය පිහිටා තිබීම **කතරගම** නගරය ප්‍රසිද්ධියට පත් වීමට බල පෑ ප්‍රබලතම හේතුව වී තිබේ. තම ජීවිතවලට ආශීර්වාදය ලබා ගැනීමත් ලෞකික අපේක්ෂාවන් මුදුන් පත් කර ගැනීමත් අරමුණු කර ගෙන **සිංහල, දෙමළ,** මෙන් ම **මුස්ලිම්** ජනයා ද මේ පුදබිමට පැමිණ කතරගම දෙවියන් ඉදිරියේ පුද පූජා පවත්වන අයුරු වසරේ ඕනෑ ම කාලයක දී දැක ගත හැකි ය.

## අවබෝධය

1. **කතරගම දෙවියන් සඳහා යෙදෙන නම් දෙකක් පාඩමෙන් උපුටා ලියන්න.**
   - ස්කන්ද කුමාර
   - බරනෙත
   - ශරවනභව

2. **දේවාලයේ ප්‍රවේශ දොරටුවේ ස්වරූපය විස්තර කරන්න.**
   - දේවාලයේ ප්‍රධාන දොරටුව පිත්තල කැටයමින් අලංකාර කරන ලද විශාල උළුවස්සකින් යුක්ත ය.

3. **දේවාලයේ තේවාකරුවන්ගෙන් දෙදෙනකු නම් කරන්න.**
   - ආලත්ති අම්මලා
   - කපුරාල
   - බස්නායක නිලමේ

මෙම දේවාලයෙහි ලොකු කුඩා සියලු කටයුතු කිරීම සඳහා පත් කරන ලද තේවා මඬුල්ලක් සිටින අතර ඈත අතීතයේ සිට ම මෙම තේවා මඬුල්ල එදිනෙදා තේවාවෙහි නිරත වෙයි.

දේවාලයේ දිවා රෑ ආරක්ෂාව සඳහා තේවාකාරයෝ 18 දෙනෙක් ද කපුරාලලා 12 දෙනෙක් ද ආලත්ති පූජා සඳහා කාන්තාවෝ 24 දෙනෙක් ද දේවාලයට ඇත් ගොව්වෝ 4 දෙනෙක් ද අය බදු ගැනීම සඳහා මොහොට්ටි ලේකම් කෙනෙක් ද දෙවියන්ට යාඥා කිරීම සඳහා හා වියවුල් බේරීමට එක් කෙනෙක් ද පෙරහැර සංචාරයේ දී අවුල් වළක්වා ගැනීමට නිලමේවරු එක් කෙනෙක් ද දෙවියන් වැඩමවීම සඳහා බස්නායක නිලමේ කෙනෙක් ද ආදි වශයෙන් තේවා කරුවෝ සේවයේ යෙදී සිටිති. මෙම තේවා කරුවන්ට නියමිත දේවකාරි කටයුතු තල්පතක ලියා දේවාලයේ ලේකම් (ලේඛන) සාදවා ඇත.

4. **බස්නායක නිලමේට පැවරෙන රාජකාරිය දක්වන්න.**
   - දේවාලය හා සම්බන්ධ පත්වීම්, වැටුප් දීමනා, නින්දගම් පරිපාලනය හා ආදායම් එකතු කිරීම ආදි දේවාලයේ පරිපාලනය ඇතුළු කුදු මහත් සියලු කාර්යයන්හි වගකීම පැවරෙන්නේ බස්නායක නිලමේතුමාට ය.

**5. කාවාඩි පූජා විධි පහ නම් කරන්න.**

- පරව් කාවාඩි
- භක්කි කාවාඩි
- ගිනි කාවාඩි
- කිරි කාවාඩි
- මත්ස්‍ය කාවාඩි

කාවාඩි පූජාව හා සම්බන්ධ කාවාඩියෙහි උපත පිළිබඳ ජනප්‍රවාදයක් පවතී. සුර අසුර යුද්ධයේ දී දෙවියනට ප්‍රතිවිරුද්ධ වූ සූරපද්ම නම් අසුරයා සමග කළ සටනින් පැරදුණු හිඩම්බේශ්වර, අගස්ති ඍෂිවරයා වෙත ගොස් සැඟවී තමාට ජීවිත දානය ලබා දෙන මෙන් කඳ කුමරුගෙන් ඉල්ලා සිටියේ ය. ශිවගිරි හා සප්තගිරි නමැති කඳු දෙක ඔසවා ගෙන ධ්‍යාන ක්‍රීඩාවෙහි යෙදෙන්නේ නම් එය කර දෙන බව අගස්ති ඍෂිගේ පිළිතුර වූයෙන් යථෝක්ත කඳු දෙක දණ්ඩක දෙක දෙකළවර බැඳගත් හිඩම්බේශ්වර, ධ්‍යාන ක්‍රීඩාවෙහි යෙදෙන්නට විය. එක් අවස්ථාවක දී ශරීර කෘත්‍ය සඳහා එය බිම තැබූ පසු යළි එය ඔසවන්නට නො හැකිවීම නිසා විමසිලිමත් වූ හිඩම්බේශ්වරට දකින්නට ලබුණේ කුඩා කොලුවකුගේ වේශයෙන් ස්කන්ධ කුමාර සැඟවී සිටින බව ය. සටන නැවතත් ඇරඹිණ. හිඩම්බේශ්වර මරුමුවට පත් විය. එහෙත් අගස්ති ඍෂිවරයාගේ ඉල්ලීම නිසා ස්කන්ධ කුමාර හිඩම්බේශ්වරට පුනර්ජීවය ලබා දී තමාගේ සෙන්පති ධූරයට පත් කර ගත්තේ ය. කාවාඩි පූජාව ඇරඹුණේ මේ සිද්ධිය සිහිපත් කිරීමට යැයි විශ්වාස කෙරේ

**6. කතරගම දේවාලයේ පැවැත්වෙන උත්සව තුන නම් කරන්න.**

- ඇසළ උත්සවය
- කප් සිටුවීම
- ගිනි පෑගීමේ හා දිය කැපීමේ පුරාණ චාරිත්‍ර

**7. කතරගම දේවාලය ආශ්‍රිතව සිදු කෙරෙන පුද සිරිත් දෙකක් හඳුන්වන්න.**

- **ගෙවදීම** - මෙහි 'ගෙවදීම' යනු දේවාලයේ කටයුතු සඳහා පත් කිරීමයි. මේ සඳහා බස්නායක, බෙත්මේවරුන්, අදිකාරම්, ලේකම් කපුරාලලා යන අයගෙන් සැදුම්ලත් නිලධාරි මඬුල්ලක් වෙයි. මහා සංඝරත්නයේ සෙත් පිරිත් මධ්‍යයේ ගෙවදීම සිදු කෙරේ. තෝරා පත් කර ගන්නා නවක තේවාකරු සිය රාජකාරිය අරඹන්නේ දේවාලයේ නැකත් කරු විසින් නියම කරනු ලබන නැකතකට අනුව ය. ගෙවදීමට සූදානම් වූ තේවාකරු පළමුවෙන් ම තැම්බූ දෙහි හිසේ තවරා ශරීරයේ කහ පැන් වත් කොට මැණික් ගඟෙහි ජලයෙන් ස්නානය කෙරේ. අනතුරු ව රන් කෙන්දෙන් කන් විද තෝඩු පළඳයි. ඉන් අනතුරු ව නව වැඳුම කළ යුතු වෙයි.

- **නව වැඳුම** - දේවාලයට ඇතුළු වන දොරටුව අබියස ද දේවාලය මැද දී ද තිරය සමීපයේ දී කෙරෙන මෙම වැඳුම කෙරෙන්නේ එක්තරා පිළිවෙළකට ය. දකුණු කකුල පෙරට තබා තෙවරක් ද දෙකකුල් එකට තබා ගෙන තෙවරක් ද, උක්කුටියෙන් හිඳ ගෙන තෙවරක් ද වශයෙන් වැඳීම නව වැඳුම නම් වේ.

- **මුළුතැන් බෑම** - දෙවියන් සඳහා ආහාර සැපයීම මුළුතැන් බෑම (මුරුතැන්) යනුවෙන් අදහස් කෙරේ. දිනකට තුන්වරක් දෙවියන් උදෙසා ආහාර පූජා කිරීම දක්නට ලැබේ. මෙම කාර්යය සඳහා මුළුතැන් ගෙය නමින් ගෙයක් ද වෙයි. මුළුතැන් ගෙන ඒම සඳහා මණ්ඩය යනුවෙන් හඳුන්වන කදකි. අඩි පහක් පමණ දිගැති ලීයක දෙකොණෙහි රෙදිවලින් සකසන ලද ඔලගු දෙකක් ගැට ගැසීමෙන් 'මණ්ඩය' සකසා ඇත. මෙම මණ්ඩය මුළුතැන් ගෙහි සිට දේවාලය වෙත ගෙන එනු ලබන්නේ කදකිනි. එය ගෙන ඒම තේවාව කරන කපුරාලට පැවරෙන කාර්යයකි.

  මුළුතැන් සකස් කරන්නේ එදින ම කාන්තාවන් විසින් වී ලාස් 5ක් කොටා සකස් කරනු ලබන සහල් උපයෝගි කර ගෙන ය. එක් වේලක් සඳහා හාල් සේරු තුනක් යොදා ගැනේ. සෙනසුරාදා උදෑසන මුළුතැන් පූජාව සිදු නො කෙරේ. එදින උදේ නානු මුරය පවත්වනු ලැබේ. නානුමුර චාරිත්‍රය ඉටු කිරීම (දිය නෑම) සඳහා සෙනසුරාදා උදය යොදා ගනියි.

  මේ (ආහාර) පිසන්නා විසින් සුදු මුඛ වාඩමකින් සැරසී ආහාරය පිසිනු ලබයි. මෙම ආහාරය බෙදනු ලබන්නේ එක්තරා පිළිවෙළකට ය. බුද්ධ පූජාව සඳහා රන් පාත්‍රය ද දේවා පූජා සඳහා මණ්ඩය ද මේ පිසින්නාගේ බඳුන ද ආහාර බෙදන මේසය මත පිළිවෙළින් තබනු ලැබේ. අනතුරුව බුද්ධ පාත්‍රයට එක් හැන්දක් ද දේව මණ්ඩයට හැඳි තුනක් ද තමන්ගේ පිඟානට

එක් හැන්දක් ද වශයෙන් තෙවරක් ආහාර බෙදනු ලැබේ. දේවාල භූමියෙහි පිහිටි කිරි වෙහෙරට බුද්ධ පූජාව පිළිගැන්වීමෙන් අනතුරු ව කපුරාල දේව පූජාව රැගෙන යයි.

මුළුතැන් කදෙහි එක් මණ්ඩයක බත් ද අනෙක් මණ්ඩයෙහි ව්‍යඤ්ජන ද තබා සකස් කෙරෙන මුළුතැන් අඩුක්කුව උඩු වියන් පාවඩ හා හේවිසි සහිත ව දේවාලය තුළට ගෙන යනු ලැබේ. මේ අවස්ථාවේ සියලු ම තේවාකරුවන් දේවාලයෙහි සිටීම අනිවාර්ය වේ.

- **නානුමුර මංගල්‍යය** - බුදුන් උදෙසා පවත්වන පූජා විධියකි. නානුමුරය හෙවත් නෑවීම කෙරෙන්නේ බෝධියයි. රජවරුන්ගේ නියමය මත දෙවියන් සතුටු කිරීම සඳහා බෝධියට දක්වන උපහාරයකි. මේ සඳහා අවශ්‍ය ජලය ගෙන එනු ලබන්නේ ආලත්ති අම්මලා විසිනි. මැණික් ගඟින් ගෙන එනු ලබන ජලයට සුවඳ ද්‍රව්‍ය මුහුකොට හේවිසි නාද මධ්‍යයේ මුඛ වාඩමින් සැරසුණු කපුරාල බෝධිය කරා ගෙන ගොස් බෝධිය නාවයි.

## ලිඛිත අභ්‍යාස

**1. පහත දැක්වෙන වචන සඳහා සමාන පද පාඩමෙන් උපුටා දක්වන්න.**

I. තනතුරු - පත්වීම්
II. වස්ත්‍ර - ඇඳුමෙන් (ඇඳුම්)
III. ප්‍රමුඛතම - ප්‍රධානතම
IV. කුස්සිය - මුළුතැන්ගෙය
V. දොරටුව - ද්වාරයෙන් (ද්වාරය)
VI. රුව - රූපය
VII. කාමරය - කුටිය
VIII. කටයුතු - කාර්යයන්

**2. 'මා දුටු ඇසළ පෙරහැර' නමින් ඔබ දුටු මහනුවර දළදා පෙරහැර ගැන හෝ කතරගම ඇසළ පෙරහැර ගැන හෝ රචනාවක් ලියන්න.**

### මා දුටු ඇසළ පෙරහැර

වර්තමානයේ මහනුවර ලොවපුරා ප්‍රසිද්ධව ඇත්තේ අවුරුදු පතා පවත්වන ඇසළ පෙරහැර නිසා ය. නියං සමය නිමාවට පත් කරමින්, පවත්වන මේ මංගල්‍යය වැසි වැස්සවීමට දළදා වහන්සේට පූජෝපහාර පවත්වන උත්සවය යි. පෙර රජවරු භාරයේ තිබූ දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ වගකීම පැවරී ඇත්තේ මහනායක හිමිවරු දෙනමත්, දියවඩන නිලමේතුමාටත් ය. අස්ගිරි මහා විහාරයේ මහනායක හිමියන් හා මල්වතු මහා විහාරයේ මහනායක හිමිපාණනන් එම දෙනම ය. දළදා වහන්සේ රැක බලා ගන්නා ප්‍රධනතම ගිහි නිලධාරියා දියවඩන නිලමේතුමා ය. දියවඩන නිලමේ අර්ථය, ජලය වැඩි කරන නිලධාරියා යන්නයි. වර්ෂාව මගින් ජලය වැඩිකිරීමේ ශක්තිය දළදා වහන්සේට ඇති නිසා උන්වහන්සේ භාරව කටයුතු කරන නිලධාරියාට දියවඩන නිලමේ යැයි ව්‍යවහාර වේ. දඹදිව් තලයේ සිට දළදා වහන්සේ වැඩමවාගෙන එන ලද්දේ හේමමාලා කුමරිය හා දන්ත කුමරු විසිනි. එවක ලක්දිව රජකළේ කීර්ති ශ්‍රී මේඝවර්ණ හෙවත් කිත්සිරි මෙවන් රජතුමාය.

දළදා වහන්සේ සෙංකඩගල පුරවරයට වඩමවා ගෙන ඒමේ ගෞරවය හිමිවන්නේ (I) වන විමලධර්මසූරිය රජතුමාට ය. මෙතුමා කන්ද උඩරට රාජධානියේ ආරම්භකයා යි. දෙල්ගමු රජමහා විහාරයෙහි වැඩ සිටි දළදා වහන්සේ මහනුවරට වඩම්මවා ගෙන තම රාජමාළිගාවට යාබදව අලුතෙන් දෙමහල් මන්දිරයක් ඉදිකොට දළදා වහන්සේ එහි තැන්පත් කළේ ය. ආගම - කලාව - දේශපාලන බලය මනාව සංයෝග කරන මහෝත්සවයක් වූ ඇසළපෙරහර ලාංකික බෞද්ධයන් බුදුන් වහන්සේටත්, දළදා වහන්සේටත්, දෙවි දේවතාවන්ටත් දක්වන අප්‍රමාණ ගෞරවයත්, ශ්‍රද්ධාව හා භක්තියත් හෙළි කරයි. ඇසළ පෙරහර පාරම්පරික කලාකරුවන්ගේ කලාකුසලතා ද උත්කර්ෂවත් අයුරින් පෙන්නුම් කරයි. ගුරුකුල වශයෙන් පරම්පරාවෙන් පරම්පරාවට පැවත ගෙන ආ නැටුම්, ගැයුම් හා වැයුම් මෙහිදී ප්‍රදර්ශනය කෙරේ. රජ දවස කලාකරුවන්ට මේ සඳහා කුලී ගෙවිණ; ඉඩකඩම් ලැබිණ.

ඇසළ පෙරහර රජු සතු දේශපාලන බල මහිමය ජනතාව හමුවෙහි පෙන්නුම් කරයි. විවිධ කොට්ඨාස පාලනය කරන දිසාවේවරු හා නිලමේවරු මහනුවර පැමිණ, පෙරහැරේ ගමන් කරමින් සිය රාජ පාක්ෂිකභාවය දක්වති. ඒ ඒ පළාත්වල කොඩි ද මෙහි ද ප්‍රදර්ශනය කෙරේ.

ඇසළ පෙරහර වැස්ස අනුකරණය කරයි. වැස්ස ලබාගැනීමට නම්, වැස්ස අනුකරණය කළ යුතු යැයි පැරැණියෝ සිතූ හ. වහින්නට පෙර හෙණ ගැසීම් , විදුලිය කෙටීම් වැනි වලාකුළු ආදිය මේ පෙරහරේ දක්නට ලැබේ. මේ පෙරහැර අවසන් වන්නේ වැසි පොද වැටෙන පරිදි දිය කැපීමේ මංගල්‍යයකිනි. දළදා පෙරහැර දින දහයක් තුළ කුඹල් පෙරහැර සහ රන්දෝලි පෙරහැර ලෙස පැවැත්වේ. දේවාල වටේ පමණක් ගමන් කරන පෙරහැර කුඹල් පෙරහැර ලෙස හඳුන්වයි. කුඹලා නම් කෘමියා තම තුඹස වටා යන ගමනට සමාන කර දැක්වීම නිසා මේ නම යෙදුණා විය හැකි ය.



ඒ ඒ දේවාලවලට අයත් රන් කෙණ්ඩිත්, රන් කඩුත් ගෙන යන්නේ රන්දෝලි පෙරහැරේ ය. රන්දෝලි යන්නෙන් වෙනත් ආර්යාවන් ගිය බවක් ද කියවේ. රන්දෝලි පෙරහැර දින පහක් පැවැත්වේ. මහ පෙරහැර පැවැත්වෙන අවසාන රාත්‍රිය මහනුවර ඇසළ පෙරහැරේ අලංකාරවත් ම රාත්‍රිය යි. දළදා කරඬුව පසුදා පහන්වන තෙක් අස්ගිරි විහාරබද ආදාහන මළුව ගෙඩිගේ විහාරයෙහි තැන්පත් කෙරේ. පසුදා උදේ 3 ට පමණ සතර දේවාලවල කපු මහත්වරු පේරාදෙණිය අසල ගැටඹේ තොට බලා පෙරහැරින් පිටත්ව කලින් අවුරුද්දේ පුරවා ගත් දිය සහිත රන්කෙන්ඩි හා රන්කඩු ගෙන, සුදු කඩතුරාවකින් වැසූ පාරුවකින් ගඟ මැදට යති. කඩතුරාවට මුවා වී කෙණ්ඩිවල දිය හිස් කරන අතරතුර ම ඒවා නැවත පුරවා ගනිති. එසේ පුරවා ගන්නා විට ඒ දිය රන් කඩුවකින් කැපීම සිරිතයි. එබැවින් මේ සිරිත 'දිය කපනවා' යනුවෙන් හැඳින්වේ.

**ගුණාත්මක යෙදවුම් :**

- කතරගම පුදබිම හා පුද පූජා - අලුත්වැවේ සෝරත නාහිමි
- කතරගම හා එහි උත්සව - අසෝක මාලිමගේ (පරිවර්තන)

**යෝජිත පැවරුම් :**

- කතරගම ඇසළ පෙරහැර පිළිබඳ ව තොරතුරු ඇතුළත් කරමින් පොත් පිංචක් සකස් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය :**

- කතරගම පුදබිම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- විවිධ පුදපූජා පිළිබඳ තොරතුරු පැහැදිලි කරයි.
- විවිධ ජාතීන්ගේ සිරිත් විරිත් හා පුදපූජා විධි අගය කරමින් කතා කරයි.
- විවිධ ජාතීන් සමග සහයෝගයෙන් කටයුතු කරයි.

**ඉගෙනුම් පල :**

- ජන වර්ගවලට අයත් සිරිත් විරිත් හඳුනා ගෙන විස්තර කරයි.
- විවිධ පුද සිරිත් අගය කරමින් කතා කරයි.
- විවිධ පුදපූජා පිළි බඳ සිරිත් විරිත් ඇතුළත් ලිපි ලේඛන කියවයි.
- විවිධ ජන වර්ගවලට අයත් සිරිත් විරිත් ඇතුළත් ලිපි ලේඛන කියවයි.

හසිත හෙට්ටිආරච්චි
**Online Class Details 071-9020298**

දළදා පෙරහැර ආරම්භ වූයේ කවදා ද යන්න පිළිබඳ නිශ්චිත නිගමනයක් දිය හැකි නො වේ. විජය ප්‍රමුඛ උතුරු ඉන්දියානු ආර්ය ජනයාගේ ආගමනය සමග දඹදිව පැවති ආෂාඪ උත්සවය මෙහි ද පැවැත්වීමට කටයුතු යෙදීම ඇසළ පෙරහැර ආරම්භ වීමට හේතු වූ බව මෙහි ආරම්භය සම්බන්ධ එක් අදහසකි. ඇසළ පෙරහැර, සුරාසුර යුද්ධයේ දී සුරයන් ජයග්‍රහණය ලැබීම සැමරීමට ආරම්භ වූ බවට ද මතයක් වෙයි. තවත් අදහසක් නම් වංකනාසික තිස්ස රජු (ක්‍රි.ව. 110-113) සමයෙහි සොළී ආක්‍රමණයේ දී පැහැර ගත් සිංහල සිරකරුවන් 12000ක් ද 12000ක් සොළී ජනයා ද පාත්‍රා ධාතුව ද සමග පත්තිනි දේවියගේ රන් සලඹ ආදි පූජ්‍ය වස්තු, ගජබා රජු විසින් නැවත සිරිලකට ගෙන ඒම සිහි කිරීමට ඇසළ පෙරහැර ආරම්භ වූ බව යි.

වර්තමාන මහනුවර ඇසළ පෙරහැරේ ආරම්භය ක්‍රි.ව. දහ අටවන සියවස මැද භාගයේ දී පමණ සිදු වන්නට ඇතැයි සැලකේ. ඊට ඇතුළත් වූයේ නාථ, කතරගම, විෂ්ණු, පත්තිනි යන සතර දේවාලයේ පෙරහැර පමණි. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ අනුශාසනා පරිදි කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව.1747-1782) විසින් එකී සතර පෙරහැරට දළදා මාලිගාවේ පෙරහැරක් ද එක් කිරීම හේතුවෙන් ඇසළ පෙරහැරට බෞද්ධ මුහුණුවරක් ලැබුණු සේ සැලකිය හැකි ය. ඒ අනුව වර්තමාන දළදා පෙරහැරේ ආරම්භය කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස සිදු වූ සේ සැලකීම යෝග්‍ය ය.

පැරණි දළදා පෙරහැර සංස්කෘතිකාංග ප්‍රදර්ශනයට වඩා රාජ්‍ය බලය පෙන්වීමේ අවස්ථාවක් වූ බව පැරණි වාර්තා පිරික්සීමේ දී පෙනී යන කරුණකි. එවකට ලංකාවේ ආණ්ඩුකාරවරයා වූ ශ්‍රීමත් එඩ්වඩ් බාන්ස්ගේ අවසරය පරිදි 1828 මැයි 29 දින පැවැත්වුණු දළදා පෙරහැර පිළිබඳ ලිඛිත විස්තරයට අනුව, පෙරහැර ආරම්භ වී ඇත්තේ යුද්ධාචාර මධ්‍යයේ ය.

> “කාලතුවක්කු වෙඩි සහ කොඩිතුවක්කු විසිපහ ගණන් ගත නො හැකි තරම් මහත් ඝෝෂාවක් එදා පැවැත්තුවා ය. මෙයාකාර මහත් ගෞරවයෙන් කරඬුව වැඩමවා ගෙනැවිත් ඇතා ළඟ සිටිය පල්ලේගම්පහේ මහනිලමේ අතට උතුමාණන්වහන්සේගෙන් කරඬුව ලැබුණා ය. ඇතා පිට සිටිය මාතලේ දිසාපති මහත්මයා සහ උඩපළාතේ දිසා මහත්මයාත් විසින් රන්හිලිගේ අභ්‍යන්තරයට කරඬුව වැඩමවා ඇතා පිටින් බිමට බැහැපු තැන තේවාව භාණ්ඩ අරගත් සැම රදලවරු විසින් ම උතුමාණන්වහන්සේට වැඩ සිටීමට තනා තිබුණ ප්‍රථම මණ්ඩපයට උතුමාණන්වහන්සේ කැඳවාගෙන ගොස් එහි පොරොත්තු කළා ය.”

එකල අලි ඇතුන් පිරිවරා ගත් ප්‍රදේශීය නායකයෝ ඔවුන්ගේ ධජ සහ ලාංඡන රැගෙන හමුදාව පිරිවරා ගෙන පෙරහැරට එක් වූහ. වර්තමානයේ එය දළදා මාලිගාවේ නිලධාරීන් සහ ගං දහයේ විදානෙලා ඇතුළු ප්‍රාදේශික සුළු නිලධාරීන් පිරිසකට සීමා වී තිබේ. ඉහත දැක්වුණ අවධියට වඩා වර්තමානයේ දළදා පෙරහැර නර්තනාංග රැසකින් සමන්විත ය. වෙස් නැටුම් ආදි විචිත්‍රාංග රැසක් එයට එක් වී තිබේ.



දළදා මාලිගාවේ නැකත් මොහොට්ටාල විසින් නියම කරනු ලබන සුබ මොහොතින් 'කප් සිටුවීමෙන්' පෙරහැර ආරම්භ වෙයි. කප් සිටුවීම යනු සතර දේවාලයේ පිරිසක් ඇසළ මස අමාවක දිනට දින කිහිපයකට පෙර පල නො හට ගත් කොස් ගසකට පුද පූජා පවත්වා එහි අරක් ගත් දෙවියෙක් වේ නම් ඉවත්ව යන ලෙස ආයාචනා කොට ගස කපා, එහි කඳෙන් රියන බැගින් දිගැති කොටස් සතරක් කපා ගෙන දේවාල සතරට බෙදා ගෙන පෙරහැරින් ගෙන ගොස් දේවාල භූමියෙහි සිටුවීම යි.

සතර දේවාලයේ කපුවන් දේවාලයට අයත් රන් ආයුධ කප වටා වැඩම කරවන, කුඩ, කොඩි, සේසත්, දවුල්, හොරණෑ සහිත පෙරහැර, 'දේවාල පෙරහැර' ලෙස හැඳින්වෙයි. එය කප් සිටුවූ දින සිට පස් දිනක් සන්ධ්‍යා කාලයේ පැවැත්වෙයි. පස් වන දිනයේ සිවු දේවාලයේ බස්නායක නිලමෙවරුන් ඇතුළු නිලධාරීහු රන්සිවිගෙයක රන් ආයුධ හිඳුවා රන්සිවිගෙය ඇතුපිට තබා පෙරහැරින් අවුත් දළදා මාලිගාව ඉදිරිපිට දේව සංහිඳේ දී දළදා කරඬුව සහිත රන්සිවිගෙය වැඩමවන, මාලිගාවේ ඇතා ප්‍රමුඛ පෙරහැර පෙරටු කර ගෙන පස් දිනක් වීථි සංචාරය කරති. මෙය 'කුඹල් පෙරහැර' නම් වෙයි. පෙරමුණේ රාල, ගජනායක නිලමේ, කාරියකරවන රාල, දියවඩන නිලමේ ආදි නිලධාරීන් ද කසකරුවන්, කොඩි, සේසත්, පන්දම් දරන්නන්, පාවඩ එළන්නන්, දවුල්, බෙර, හොරණෑ ආදිය වයන්නන්, නැට්ටුවන්, පන්තේරුකරුවන් ආදීන්ගෙන් මේ පෙරහැර සමන්විත වෙයි.

 

සතර දේවාලයන්හි දේවාභරණ වැඩමවන වාහන (රන් දෝලි), කුඹල් පෙරහැර ආරම්භ වී පස් වන දිනයෙහි පෙරහැර අගට එක් කෙරෙයි. 'රන් දෝලි පෙරහැර' නමින් හැඳින්වෙන්නේ එය යි. දළදා පෙරහැරේ කූටප්‍රාප්තිය ලෙස සැලකිය හැකි මෙම පෙරහැර හේවිසිකරුවන් හා හොරණෑකරුවන්, නැට්ටුවන්, අලි ඇතුන් ආදීන්ගෙන් ප්‍රමාණාත්මකව කුඹල් පෙරහැරට වඩා විශාල වන අතර ම විචිත්‍රත්වයෙන් ද අනූන ය. මෙය ද දින පහක් මුළුල්ලේ පැවැත්වෙන අතර අවසාන දින දෙකෙහි පෙරහැර අතිශය අලංකාරවත්ව පවත්වනු ලැබේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයට පෙර ඇත් පෙරහැරේ එක් පසෙකින් රන් දෝලි ගෙන යෑමේ සිරිත පැවතිය ද රජුගේ නියෝග පරිදි එය පෙරහැරේ අගට එක් වූ බව කියැවේ.



රන් දෝලි පෙරහැරේ පස් වන දින රාත්‍රියේ පෙරහැර අවසානයේ අස්ගිරි විහාරයේ ආදාහනමළු විහාරයෙහි කරඬුව චාරිත්‍රානුකූලව තැන්පත් කෙරෙයි. පසුදා අලුයම සතර දේවාල පෙරහැර ගැටඹේ තොටේ දිය කැපීමට එක් වෙයි. දිය කැපීම සුර අසුර යුද්ධයේ දී අසුරයන් මැරූ කඩු සුරයන් විසින් සේදීම සංකේතවත් කරනු ලබන බවට මතයකි. ඒ පිළිබඳ අනෙක් අදහස වන්නේ ගජබා රජු සමග සොළී රටට ගිය නීල මහා යෝධයා සිය යගදාවෙන් ගසා මුහුදු දිය දෙබෑ කළ අයුරු දැක්වීමට දිය කැපීම සිදු කෙරෙන බවයි. දේවාලයවල කපු මහත්වරු ගඟ මැදට ගමන් කර පෙරහැරට සිටුවූ කප සහ ගිය වර්ෂයේ ලබා ගත් ජලය ගං ජලයට එකතු කරති. ඉන් පසුව රන් කඩුවෙන් ගඟ දිය දෙබෑ කර කෙණ්ඩියට ගන්නා ජලය පෙරහැරින් ගෙන එනු ලැබේ. දිය කැපීමෙන් පසු මහනුවර ගණ දෙවි කෝවිලට පැමිණෙන මෙම පෙරහැර එහි දී නැවතී පුද පූජාවල නිරත වෙයි. සවස් වරුවේ දළදා පෙරහැර අස්ගිරි විහාරයේ දී සූදානම් වන අතර නියමිත වේලාව හඟවන වෙඩි හඬ අනුව සිවු දේවාල පෙරහැර ද එක් වී වීථි සංචාරය කොට සුබ මොහොතින් දළදා මාලිගයට ප්‍රවිෂ්ට වෙයි. සිවු දේවාල පෙරහැර ඒ ඒ දේවාලය කරා යයි. මෙය 'දවල් පෙරහැර' නම් වෙයි. මින් පසු දින හතක් විෂ්ණු දේවාලයේ 'වලියක් නැටුම' නමැති ශාන්තිකර්මය සිදු කෙරෙන අතර සත් වන දිනයේ වස් දොස් හැරීම සඳහා වන 'ගරා යක් නැටුමෙන්' පෙරහැර හා සම්බන්ධ කටයුතු අවසන් කෙරෙයි.



අතීතයේ සිට මේ දක්වා විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් පවත්වා ගෙන ආ නමුදු දළදා පෙරහැර ගමන් කිරීමේ සාම්ප්‍රදායික අනුපිළිවෙළක් ද දක්නට ලැබේ. එකී පෙළගැස්මේ තිබෙන සමහර පෙරහැර අංගවල සංකේතාත්මක අර්ථ ද ඇති බවට අදහසක් පවතී. නියඟයෙන් හා දුර්භික්ෂයෙන් රට ආරක්ෂා කර ගෙන රාජ්‍ය විචාරීම පාලකයාගේ යුතුකමකි. ඒ සඳහා ජලය අත්‍යවශ්‍ය ය. වැස්සට අධිපති ඉන්ද්‍ර දෙවියන්ගේ නියෝජිතයා ලෙස රජතුමා මේ සියල්ල සංකේතාත්මකව ඉටු කරයි. කප් සිටුවීම, දිය කැපීම ආදිය ජලය හා සම්බන්ධ සංකේතාත්මක කාර්ය සේ සැලකේ. එනිසා ම දළදා පෙරහැර ජලය ආශ්‍රිත උත්සවයක් ලෙස ද සැලකෙයි. වැස්ස ආශ්‍රිතව කෙරෙන විදුලි කෙටීම කස පිපිරවීමෙන් සංකේතවත් කෙරෙයි. ඉන්ද්‍ර දෙවියන්ගේ වැසි වලාකුළු මෙන් ම රජුගේ ශක්තිය ද අලි ඇතුන්ගෙන් සංකේතවත් කෙරේ. සාමාන්‍ය ජනයාගේ සහභාගිත්වයෙන් කෙරෙන පෙරහැරවල දී අලි ඇතුන් වෙනුවට ගවයා යොදා ගැනීම දැකිය හැකි ය. නවගමුව පත්තිනි දේවාලයේ ඇසළ පෙරහැර ඊට නිදසුනකි. හෙණ හඬෙහි දෝංකාරය සිහි ගැන්වීමට බෙර හඬ යොදා ගැනෙන බව පිළිගැනේ.

මුල් යුගයේ ඇසළ පෙරහැරෙහි අසිරිය හා සැරසිලි චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව දේශීය මූලාශ්‍රයවල මෙන් ම ෆාහියන්, හියුං සාං ආදීන්ගේ දේශාටන වාර්තාවල ද සඳහන් වේ. රොබට් නොක්ස්ගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථයෙහි සහ බ්‍රිතාන්‍ය පාලන සමයේ උඩරට සංචාරයක යෙදුණු වෛද්‍ය වයිටර් හෝප් ඉදිරිපත් කළ වාර්තාවල කප් සිටුවීමේ පටන් ගෙවදීම දක්වා වූ සියලු විස්තර ඇතුළත් කර ඇත. ජෝන් ඩේවි, විල්හෙල්ම් ගයිගර්, හර්බට් කුෂ්මාන් ආදීන්ගේ ලේඛනවල ද ඇසළ පෙරහැර පිළිබඳ තොරතුරු ඇතුළත් ය. විලියම් ලිට්ල්මාන් නැමැත්තා ඇසළ පෙරහැර චිත්‍රයට ද නගා ඇත.

විදේශිකයන්ගේ ඇසින් දුටු සාක්ෂිවලට අමතරව **මහාවංසය, දීපවංසය, දාඨාවංසය, පූජාවලිය, දළදා සිරිත, දළදා පූජාවලිය, දළදා වතුර, එළු දළදා වංශය, දළදා පුවත, දළදා වරුණ** ආදි ග්‍රන්ථවල ද ඒ ඒ අවධියේ දළදා පෙරහැර පැවැත්වූ ආකාරය පිළිබඳ තොරතුරු රැසක් ඇතුළත් ය.

(14) පාඩම

Sithmi

# කතරගම පුදබිම

* බුදු රජාණන් වහන්සේ තුන්වන වරට ලංකාවට වැඩම කළ අවස්ථාවේ කතරගම පාලනය කලේ මහාසේන නම් පාලකයෙකු බවත් කතරගම ප්‍රදේශයේ ඔහුට අයත් කිහිරි වනයක බුදුරජාණන් වහන්සේ සුවයෙන් වැඩසිටි බවත් ධාතුවංශය සඳහන් කරයි. රුහුණු පුරයේ මෙන්ම බුදු දහමේ ද ආරක්ෂකයා වශයෙන් සැළකෙන්නේ කතරගම දෙවියන් ය.

මෙම දෙවියන්ගේ ප්‍රධාන නගරය පිහිටා තිබීම. කතරගම නගරය ප්‍රසිද්ධියට පත් වීමට බලපෑ ප්‍රබලතම හේතුව තිබේ.

## අවබෝධය

1. ස්කන්ධ කුමාර, බරනෑත, ශරවණබව
2. දේවාලයේ ප්‍රධාන දොරටුව පිත්තල කැටයමින් අලංකාර කරන ලද විශාල උළුවස්සකින් යුක්ත ය.
3. ආලත්ති අම්මලා, බස්නායක නිලමේ තුමා, කපුරාල

4. දේවාලය හා සම්බන්ධ පත්වීම්, වැටුප් දීමනා
නින්දගම් පරිපාලනය හා ආදායම්
එකතු කිරීම් ආදී දේවාලයේ පරිපාලනය
ඇතුළු කුදු මහත් සියලු කාර්යයන්හි
වගකීම.

5. පරවි කාවඩි, භක්ති කාවඩි

පරවි කාවඩි
භක්ති කාවඩි
ගිනි කාවඩි
කිරි කාවඩි
මත්ස්‍ය කාවඩි

6. * නුනු මුර මංගල්‍යය.

ස
* ඇළ උත්සවය

* කප් සිටුවීම.

ඇසළ උත්සවය
කප් සිටුවීම
ගිනි පෑගීමේ හා දිය කැපීමේ පුරාණ චාරිත්‍ර

7. කාවඩි පූජාව
මුල් තැන් පූජාව

ගෙවදීම
නව වැදුම
මුවිතැන් බෑම
නානුමුර මංගල්‍යය